**උතුරු අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 2013**

**------------------------------------------**

උතුරු අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**--------------------------------------------------------------------------------**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වනුයේ පිළිවෙලින් එවකට මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග,උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරියයි. උතුරු අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, කොළඹ හා යාපනය අවසානයේදී සම්බන්ධ කිරීම සඳහා ජාතික අධිවේගී මාර්ග ජාලයේ කොටසක් සකස් කෙරෙන උතුරු අධිවේගි මාර්ගය ඉදිකිරීමයි. යෝජිත මහනුවර අධිවේගී මාර්ගය සඳහා වෙනම සම්බන්ධයක් සහිතව කොළඹ සිට දඹුල්ල දක්වා කිලෝ මීටර් 191 ක අධිවේගී මාර්ගයක් ඉදිකිරීම සඳහා ව්‍යාපෘතියේ පළමු අදියර පැකේජ 10 කින් සමන්විත වේ. විදේශ සහාය යටතේ ව්‍යාපෘතිය සඳහා මූල්‍ය වැඩ පිළිවෙල සහ ව්‍යාපෘතියේ කාලය 2013 දෙසැම්බර් 31 වන විටත් තීරණය කර නොතිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

**------------------------------------------**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි.පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්,වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, රජය විසින් සපයන ලද අරමුදල්වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඇ) අරමුදල් යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනා ගෙන තිබුණේද යන බව.

(ඉ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

**3. මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

**4. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**4.1 මූල්‍ය කාර්යසාධනය**

**-----------------------**

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘති වියදම රු.1,182,299,612 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වූ වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම |
|---|---|
| | රු. |
| ස්ථාවර වත්කම් | 995,301 |
| කෙරී ගෙන යන වැඩ | 1,181,304,310 |
| | 1,182,299,612 |

## 5. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 5.1 අරමුදල් උපයෝජනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව ව්‍යාපෘති මූල්‍යයනය, අයවැයගත ප්‍රතිපාදන හා 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාලපරිච්ඡේදය තුළ අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| | 2013 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙහි කරන ලද ප්‍රතිපාදන | සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ උපයෝජනය කළ අරමුදල් | 2013 දෙසැම්බර් 31 දින දක්වා උපයෝජනය කළ අරමුදල් |
|---|---|---|---|
| | රු.මිලියන | රු .මිලියන | රු .මිලියන |
| ශ්‍රී ලං ර | 980 | 734.8 | 734.8 |
| එකතුව | 980 | *734.8 | *734.8 |

* වර්ෂය අවසානයට ගෙවිය යුතු මුදල් ඇතුළත් නොකිරීම හේතුවෙන් මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදල සමඟ මෙම මුදල එකඟ නොවේ.

### 5.2 කොන්ත්‍රාත් පරිපාලනය

ශක්‍යතා අධ්‍යයනයන්, පාරිසරික බලපෑම් ඇගයීම් හා ලැදියාවන් පිළිබඳ ප්‍රකාශයන් කැඳවීම සඳහා ලියකියවිලි පිළියෙල කිරීම සහ උතුරු අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ අදියර 1 යෝජනාව සඳහා ඉල්ලීම සිදුකිරීම සඳහා උපදේශක සේවා වෙනුවෙන් විදේශ කොන්ත්‍රාත්කරුවකු සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ තෝරා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. විදේශ සංරචක සඳහා රු. මිලියන 552,216,465 කට සමාන ඕස්ට්‍රේලියන් ඩොලර් 3,998,671 ක පිරිවැයකට හා දේශිය සංරචක සඳහා රු.414,233,734 ක පිරිවැයකට උපදේශක සේවා සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීමට 2012 දෙසැම්බර් 19 දින පැවති රැස්වීමේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වුවද ආර්ථික , මූල්‍ය, පාරිසරික හා සමාජ කරුණු සම්බන්ධයෙන් ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යනයන් සහ සමස්ත ව්‍යාපෘති සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම 2013 දෙසැම්බර් 31 වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.